අදහසක්

කාටූන් කලාව සහ රස්සාව

කාටූන් ශිල්පියෙක් පූර්ණ කාලීන පත්‍ර කන්තෝරුවක රස්සාව කරන්න ඕන. එතකොට එයාගේ මුළු වෘත්තීයම කැප කෙරෙන්නේ කාටූන් වෙනුවෙන්. පත්‍ර කන්තෝරුවක් ඇතුලේ නිතරම කතා වෙන්නේ වෘතීයට අදාල දේවල්. රටේ ප්‍රකාශයට පත්වෙන ප්‍රකාශනවලින් 85% කට වඩා කියවන්න ලැබෙනවා. උණු උණුවෙම රටේ තොටේ සිදුවෙන සිදුවීම් දැනගන්නට ලැබෙනවා. ඒවා අහගෙන හිටියත් ඕන තරම් අදහස් එනවා. සමහර වෙලාවට ඇන්දට පස්සේ කතුවරයා ඒක පල නොකර අරින වෙලාවලුත් තියෙනවා. කොහොම උනත් කාටූන් ශිල්පියෙකුට හොඳම තැන පත්තර කන්තෝරුවක්ය කියන එක මට දැන් හොඳට දැනෙනවා. මම දිවයින සහ ලක්බිම පුවත්පත්වල සේවය කළ දවස්වල අදට වඩා සාර්ථකයි. දැන් ඉගැන්වීම්, පීඨයේ සාකච්චා, රැස්වීම්, නිබන්ධන කියවීම්, ආයතනයට සම්බන්ධ විවිධ කාරණාවලට මැදිහත් වීම් වගේ දේවලින් දවස ගෙවිල යනවා. සමහර වෙලාවට ප්‍රධාන පුවත්පිත වත් කියවන්න වෙන්නේ නෑ. මේ නිසා දවසේ හොඳම සිද්ධිය මට අහුවෙන්නේ නෑ. දිනපතා කාටූනයක් අඳින්න ඇත්නම් හොඳයි.

විනී හෙට්ටිගොඩ
කථිකාචාර්ය
ප්‍රවීණ කාටූන් ශිල්පි

DOCUMENT TRANSLATIONS WITHIN A DAY
SWORN TRANSLATIONS ● NAATI TRANSLATIONS
ඕනෑම භාෂාවකට අයත් ලේඛණයක්
සීඝ්‍රගාමී පරිවර්තනය සඳහා
අප අමතන්න
03 9792 9977
සඳුදා සිට සිකුරාදා දක්වා
පෙ.ව 9.00 - ප.ව 5.00 දක්වා විවෘතයි.
1/44 King Street Dandenong VIC 3175
WARNALEGAL
Justice for all
03 9701 3718 info@warnalegal.com warnalegal1

හැන්දෑවට පායන හිරු බැස ගියේය.

මගේ මතකය නිවැරදි නම් ඒ දෙදහස් දොළහ වර්ෂයේ නවම් මාසයේ හැන්දෑවකි. මට නියමිතව තිබුණේ ඔහු හමුවී සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමටය. සිය ජීවිතයේ අටවන දශකයටත් එළඹ සිටි ඔහු සමග මා වැනි ආධුනිකයකුට සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට ලැබීම එක්තරා අභියෝගයකි.

මම දුරකථනයෙන් කථා කොට ඔහුගේ නවාතැනේ ලිපිනය අසා සිටියෙමි. " මෙතන ඇඩ්‍රස් එකක් නැහැ. මම ඔය ළමයට මෙතනට එන පාර කියන්නං."

ඔහු නිවැරදිව මට මග කියා දුන්නේය. මා එනතුරු කවුළුවෙන් පාර බලා උන්නේය. එවකට ඔහුගේ " මග හොඳට නොතිබුණාත්" කෘතිය දොරට වැඩීමට සියල්ල සූදානම්ව තිබූ කාලයයි. ඔහුගේ කෘතියක් අරහයා මා ලියූ පළමු ලිපිය " වියපත් තරුණයාගේ සතරවන පොත් මංගලය" නමින් සිහනද පුවත්පතේ පළවිය. වියපත් තරුණයා මා අමතා සිය හදපිරි ප්‍රශංසාව පළකිරීමට තරම් ලෙංගතු විය.

සැන්දෑ සමයේ විවේකයෙන් සිටිනු වෙනුවට ඔහු කළේ නොකඩවා ලේඛනයේ නිරතවීමය. ලියන්නට ඇවැසි කාරණා ඔහු වෙත අපමණ විය. ඔහු නොසිඳෙන උල්පතක් බඳුය. දේශීය මෙන්ම ජ්‍යාන්තර දේශපාලන සමාජ ප්‍රවණතා ගැන ඔහු අවසන් මොහොත දන්වා දැනුවත්වී සිටියේය. සැබෑ ලේඛකයකුගේ ප්‍රතිභාව එය බව ඔහු නිතර සිහිපත් කළේය. නිවැරදි සිංහල ව්‍යාකරණ භාවිතාව පිළිබඳව ඔහු අතිශයින් සැලකිලිමත් විය. ඔහුගේ වියරණ දැනුම අනල්පය. වියරණ වරදා ලියන ලේඛකයෝ ඔහුගේ දෝෂ දර්ශනයට අනිවාර්යයෙන්ම ලක්වූහ. නිවැරදි භාෂා භාවිතාව හැමවිටම ඔහු අගය කළේය.



කෙතරම්වියපත් වුවද ඔහුගේ ලිපියක වියරණ දෝෂයක් මම කිසිකලක නොදුටුවෙමි. ඔහු එතරම් ඒ ගැන සවිඥානික වූවේය.

මෙල්බර්න් පුවත්පත් වල සෑම මසකම ඔහුගේ ලිපියක් නොවැරදී පළ වූ බව පුවත්පත් කියවන්නෝ හොඳින්ම දනිති. පිටතට ප්‍රදර්ශනය නොකෙරෑ අතිශය සංවේදී මනුශ්‍යයකු ඔහු ගේ ඇතුලාන්තයේ ජීවත් වන බව ඔහුගේ කෘතීන් බහුතරයක් පරිශීලනය කළ අයෙකු වශයෙන් මම දැන සිටියෙමි.

පිතු හදක ඇත සිඟිති හිඳැසක් ග්‍රන්ථයේ ඇති එක්තරා උපුටනයක් මම මෙසේ සිහිපත් කරමි.

There is a ….
Special place….
In the heart of a father….
That only his child ….
Can fill….

ඔහු එය සිංහලයට නගා තිබුණේ මෙසේය.

පිතු හදක ඇත
සිඟිති හිඳැසක්
ඔහුගේම දරුවකුට හැරෙන්නට
නොපිරවිය හැකි අන් කිසිවෙකුට

ඔහු දයාබර පියකු වූ බවට තවත් සාදක කුමටද ? එහෙත් ඔහුගේ වියෝවෙන් සිංහල සාහිත්‍යයට ඇතිවූ හිඳැස සිඟිති නැත. ඒ හිඳැස අප්‍රමාණය. ඔබට නිවන් සුව ඕ ඕ කුරුප්පු වියතාණෙනි.